නුවරඑළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). 2017 වර්ෂයේදී නානුඔය කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.3,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණද එය ඉටුකර නොතිබියදී ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණු බැවින් එම වටිනාකමින් ණයහිමියන් හා වර්ෂයේ වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම නිවැරදිව හඳුනා නොගෙන ජනවාරි සිට ජූලි තෙක් කාලයට අදාළ රු.4,368,620 ක් වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව රු.17,966,142 ක් ලැබී තිබුණු අතර, ඉන් රු.10,115,842 ක් මුද්දර ගාස්තු ආදායම් ණයගැතියන්ට බැරකර ඉතිරි රු.7,850,300 උසාවි දඩ ණයගැති ගිණුමට බැරකර තිබුණි. මේ හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු ණයගැතියෝ රු.7,850,300 ක් වැඩියෙන් හා උසාවි දඩ ණයගැතියෝ එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදල් උපයෝජනයකර ක්‍රියාත්මක කර තිබූ කර්මාන්තවල වටිනාකම රු.1,266,177 ක් කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයගැතියෝ හා වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ). සභාවට අයත් අක්කර 12 යි රූඩ් 3 යි පර්චස් 38.83 ක් වූ ඉඩම් කැබලි 21 ක , වපසරිය නිශ්චය කර නොතිබුණු ඉඩම් කැබලි 20 ක, නානුඔය පිහිටි කඩ කාමර 06 ක, කසළ එකතු කිරීමේ යන්ත්‍ර 01 ක හා කාර්යාල උපකරණ විෂයයන් 14 කට අයත් ඒකක 191 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර ආදායම රු.34,144,610ක් වුවද එය රු.35,420,539ක් ලෙස රු.1,275,929 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රාග්ධන වියදම රු.35,410,788 ක් වුවද, එය රු.35,800,687ක් ලෙස රු.389,899 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-----------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 03 ක වටිනාකම එම ගිණුම් ශේෂවලට අදාළ උපයෝගී ලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.745,470 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්
--------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.67,129,574 ක හර ශේෂයක් පැවති අතර, එම ශේෂය 2014 වර්ෂයේ සිටම හඳුනාගැනීමට කටයුතු නොකර ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්
---------------------
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 03 ක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම රු.811,733 ක් විය.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
---------------------------------------------------------
අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.44,122,476 ක වත්කම් විෂයයන් 04 ක්, රු.29,358,964 ක බැරකම් විෂයයන් 02 ක් සහ අගය රු.10,706,281 ක වූ ජ'නල් සටහන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්
--------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) ප්‍රකාරව 2014 – 2015 කාලය තුළ අවස්ථා 02 කදී ලබාදී තිබූ රු.32,000 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද පියවා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,473,986 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,575,088 ක් විය.

2.2 මූල්‍ය පාලනය

-----------------

සභාව බැංකු ශාඛාවක පවත්වාගෙන යන ජංගම ගිණුමක 2017 වර්ෂයේ ජුනි සහ ජුලි මාසවල හැර අනෙකුත් සෑම මාසයක් අවසානයේදීම රු.13,000,000 කට වැඩි මුදල් ශේෂයක් පැවති අතර 2017 ජුනි සහ ජුලි මාසවල එක් එක් මාසය අවසානයේදී රු.3,000,000 ඉක්මවා මුදල් ශේෂ පැවතුණි. මෙම අතිරික්ත මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට සලකා බලා නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,175,187 | 4,409,317 | 3,990,562 | 6,390,342 | 5,865,203 | 4,349,870 | 4,495,731 | 6,072,433 |
| කුලී | 7,219,305 | 9,147,983 | 9,199,590 | 717,899 | 23,957,372 | 7,312,409 | 6,850,021 | 2,533,165 |
| බලපත්‍ර ගාස්තු | 3,565,000 | 6,730,068 | 6,730,068 | - | 6,250,000 | 6,355,042 | 6,526,762 | - |
| වෙනත් ආදායම් | 15,129,860 | 16,259,252 | 29,920,138 | 11,767,528 | 12,270,380 | 39,951,449 | 43,822,947 | 29,770,938 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

වර්ෂය ආරම්භයේදී පැවති හිඟ වරිපනම් බදු, අක්කර බදු, ඉඩම් බදු හා කඩකුලී අයකිරීමේ ප්‍රතිශතය සියයට 35 ට වඩා අඩු අගයක් ගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් බදු, ජල ගාස්තු හා කඩ කුලී අයකිරීමද සියයට 52 ට අඩු අගයක් ගෙන තිබුණි.

2.3.3 කුලී

-----

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ කඩකුලී වටිනාකම රු.693,012 ක් වූ අතර, එකී කඩ කාමර බද්දට ලබාගෙන තිබුණු බදුකරුවන් 14 දෙනෙකුගෙන් මාස 06 සිට මාස 20 දක්වා කාල පරාසයක් ප්‍රමාදවී තිබුණු රු.95,920 ක බදුකුලී ඇතුළත්ව තිබුණි.

2.3.4 ජල ගාස්තු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු හිඟ ජල ගාස්තු ප්‍රමාණය රු.1,361,484 ක් වූ අතර, එම හිඟ ගාස්තු තුළ කඳපොල උපකාර්යාල බලප්‍රදේශයේ ජල පාරිභෝගිකයින් 30 දෙනෙකුගෙන් 2011 වසරට පෙර සිට අයවිය යුතුව පවතින රු.68,644 ක හිඟ ජල ගාස්තුද ඇතුළත්ව තිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,775,638 ක් හා මුද්දර ගාස්තු රු.9,991,890 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ව්‍යාපෘති නිමනොකිරීම

---------------------------

පාර්ක් වත්ත එස්ක්ඩේල් කොටස පානීය ජල ව්‍යාපෘතිය 2018 ජනවාරි 15 දිනට නිමකළ යුතුව පැවතුණු අතර, ඒ සඳහා රු.526,432 ක් වටිනා උපකරණ 2017 දෙසැම්බර් 29 දින මිලදීගෙන තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතියේ වැඩ 2018 ජූලි 31 දින වන විටද අවසන්කර නොතිබුණි.

(ආ). කර්තව්‍යන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

--------------------------------------

"පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2016" වැඩසටහන යටතේ නානුඔය කසල වෙන්කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2016 අගෝස්තු මසායේදී රු.3,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණු ව්‍යාපෘතිය මාස 03 ක් ඇතුළත සම්පූර්ණයෙන් නිමකර බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවද 2018 ජූලි 18 දින වන විටත් මෙම කර්මාන්තයට අදාළ කිසිදු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.

(ඇ). තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක්ද ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 14 කදී ලබාදී තිබුණු රු.793,027 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටද පියවා නොතිබුණි.

(ආ). සභාව පවත්වාගෙන යන ජංගම ගිණුමකට අදාළව 2017 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2013 පෙබරවාරි සිට 2014 දෙසැම්බර් දක්වා කාලය තුළ ලැබී තිබුණු රු.142,040 ක් වටිනා චෙක්පත් 04 ක් අගරුවී තිබුණද එම චෙක්පත්වල වටිනාකම 2017 වර්ෂයේ අවසානය වනවිටද අයකරගෙන නොතිබුණි.

(ඇ). 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර තිබූ 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන තිබූ ව්‍යාපාර 18 ක බලපත්‍රවල වලංගු කාලය අවසන්ව තිබුණ ද නව බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 12 ක පැවති පුරප්පාඩු 45 ක් සම්පූර්ණ කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). 1988 මැයි 17 දිනැති අංක 1988/ 22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව වරිපනම් බදු අයකරන ප්‍රදේශවල දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකළ යුතු වුවද ප්‍රාදේශීය සභාව 2009 වර්ෂයට පසු වරිපනම් බදු දේපළ තක්සේරු කර නොතිබුණි.

(ආ). 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/3 දරන මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව කඩ කාමර සඳහා මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව හෝ පළාත් පාලන ආයතනයක තක්සේරුකරුවකු සිටීනම් ඔහුගේ තක්සේරුව අනුව තීරණයකර අයකළ යුතුය. නමුත් සභාවේ කඩ කාමර 73 ක් සඳහා සභාවේ ආදායම් පරීක්ෂක විසින් 2014 වර්ෂයේදී කරන ලද තක්සේරුව මත කුලී අයකරමින් පැවතුණි.

3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

3.5.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

---------------------------------------------------------

සභාවේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබුණු රජයේ නිවාසය 2016 ඔක්තෝබර් 01 දින සිට පරිහරණය නොකර පැවතියද එය වෙනත් සුදුසු නිලධාරියෙකුට ලබාදීමටද කටයුතු නොකර නිෂ්කාර්යව පැවතිණි. ඒ හේතුවෙන් සභාවට අයකරගත හැකිව තිබුණු නිවාස කුලී ආදායමක්ද අහිමිවී තිබුණි.

3.5.2 පවරා නොගත් වත්කම්

---------------------------

සභාවේ කටයුතු සඳහා භාවිතා කරන බජාජ් වර්ගයේ යතුරුපැදියක සහ කුබෝටා වර්ගයේ ට්‍රැක්ටරයක අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

3.5.3 නිෂ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ). සභාව සතු ඩබල් කැබ් රථයක් සහ යතුරුපැදි 03 ක් වසර 03 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රියව පැවති අතර ට්‍රැක්ටර් රථ 02 ක් වසරකට අධික කාලයක සිට අලුත්වැඩියා කටයුතු සිදුනොකර පෞද්ගලික ගරාජයක රඳවා තිබුණි.

(ආ). සභාවට අයත් ලීටර් 5000 වතුර බවුසරය වසර 02 ක පමණ කාලයක සිට හා ලීටර් 3500ක වතුර බවුසරය වසරකට ආසන්න කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

3.5.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

--------------------------------

සභාව 2017 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණු පුස්තකාල 05 ක පොත් 642 ක ඌනතාවය සහ උපකරණ 08 ක ඒකක 15 ක ඌනතාවල වටිනාකම් ගණනය කර නොතිබුණු අතර, වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන හෝ ඌනතාවය සම්බන්ධයෙන් වෙනත් ක්‍රියාමාර්ග හෝ ගෙන නොතිබුණි.

3.5.5 වාහන උපයෝජනය

------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාවට අයත් වාහන 06 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි.

3.5.6 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

(අ). නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - කොටගල

---------------------------------------------------------------------------------------------

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොත්‍රාත්කරුවෙකු සමඟ 2015 මැයි 15 දින රු.81,476,575 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර, එම ගිවිසුම අනුව 2015 නොවැම්බර් 15 දින වන විට වැඩ නිමකළ යුතුව තිබුණි. එහෙත් 2018 ජූලි 31 දින වන විටද වැඩ නිමකර නොතිබුණු අතර අදාළ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.

(ආ). කොටගල ආයුර්වේද වෛද්‍ය නිලධාරී නිවස ඉදිකිරීම

---

කොටගල ආයුර්වේද වෛද්‍ය නිලධාරී නිවස ඉදිකිරීම සඳහා රු.1,180,000 ක ගෙවීම් කිරීමේදී බිල්පත් සකස් නොකර ගෙවීම් කර තිබුණි. එමෙන්ම ඉදිකිරීම් වල විවිධ අඩුපාඩු නිරීක්ෂණය වූ අතර 2018 ජූලි 31 දින වන විටද එම නිවාසය පදිංචිය සඳහා කිසිවෙකුටත් ලබානොදී නිශ්ක්‍රියව තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර ආදායම් විෂයයන් 06 ක සියයට 14 සිට සියයට 88 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 13 සිට සියයට 99 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ). ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ). වත්කම්/ දේපළ පාලනය | i. අයිතිය පවරා නොගැනීම<br>ii. නිෂ්කාර්යව පැවතීම<br>iii. වටිනාකම ගණනය නොකිරීම<br>iv. ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ඇ). ණයගැති/ ණය හිමි පාලනය | i. උපලේඛන පිළියෙල නොකිරීම<br>ii. ණය හිමි ශේෂ නිරවුල් නොකිරීම |
| (ඇ). සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණකර නොගැනීම |